සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2024 ජනවාරි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය

(Advanced Financial Accounting & Costing)

2024-02-10
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද පොත්වල උත්තර ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, පිරිවැය ගිණුම්කරණයට අදාලව නිවැරදි වන්නේ කුමක් ද?

(1) හැසිරීම අනුව පිරිවැය, සෘජු පිරිවැය සහ වක්‍ර පිරිවැය ලෙස වර්ග කළ හැකිය.

(2) ප්‍රාථමික පිරිවැය, වක්‍ර පිරිවැයවලින් සමන්විත වේ.

(3) පිරිවැය ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණක් වනුයේ පිරිවැය නිශ්චය කිරීම වේ.

(4) දැනටමත් දරා ඇති පිරිවැය, වර්ධක පිරිවැය ලෙස හැඳින්වේ. (ලකුණු 02)

1.2 නිෂ්පාදන සමාගමක් වන **සීමාසහිත ශාන් සමාගම** ට අදාලව පහත සඳහන් තොරතුරු ඔබට දී ඇත:

| | |
|---|---|
| යළි-ඇණවුම් ප්‍රමාණය | ඒකක 4,500 |
| පොරොත්තු කාලය | සති 4 - 6 |
| භාවිතය | ඒකක 1,200 - 3,000 |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, **සීමාසහිත ශාන් සමාගමේ** උපරිම තොග මට්ටම වන්නේ:

(1) ඒකක 18,000. (2) ඒකක 17,700. (3) ඒකක 22,000. (4) ඒකක 11,700.

(ලකුණු 02)

1.3 පහත සඳහන් ප්‍රකාශ සළකා බලන්න:

(a) සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමේ අනිවාර්ය අවශ්‍යතාවයක් ඇත.

(b) අවම කොටස්හිමියන් සංඛ්‍යාව 02 ක් විය යුතුය.

(c) අවම අධ්‍යක්ෂකවරුන් සංඛ්‍යාව 02 ක් විය යුතුය.

(d) මහජනතාව වෙත කොටස් නිකුත් කළ නොහැක.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, සීමිත පෞද්ගලික සමාගමකට අදාලව නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ:

(1) (a) පමණි. (2) (d) පමණි.

(3) (a) සහ (d) පමණි. (4) (a), (b) සහ (d) පමණි. (ලකුණු 02)

1.4 2024 ජනවාරි මාසය සඳහා වන පහත සඳහන් තොරතුරු **සීමාසහිත සූසර සමාගමෙන්** උපුටාගන්නා ලදි:

| | |
|---|---|
| මාසය සඳහා වන සත්‍ය පොදුකාර්ය පිරිවැය | රු.210,000/- |
| මාසය සඳහා වන අයවැයගත පොදුකාර්ය පිරිවැය | රු.200,000/- |
| මාසය සඳහා වන අයවැයගත යන්ත්‍ර පැය | පැය 10,000 |
| මාසය සඳහා වන සත්‍ය යන්ත්‍ර පැය | පැය 12,000 |

මාසය සඳහා වන ඌන හෝ අධි පොදුකාර්ය අන්තර්ග්‍රහණ පිරිවැය වනුයේ:

(1) රු.30,000/- ක අධි අන්තර්ග්‍රහණයකි. (2) රු.30,000/- ක ඌන අන්තර්ග්‍රහණයකි.

(3) රු.10,000/- ක අධි අන්තර්ග්‍රහණයකි. (4) රු.10,000/- ක ඌන අන්තර්ග්‍රහණයකි.

(ලකුණු 02)

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, ආර්ථික ඇණවුම් ප්‍රමාණය [Economic Order Quantity (EOQ)] ගණනය කිරීම සඳහා වන සූත්‍රයේ උපකල්පනයක් තෝරන්න:

(1) ඒකකයක් සඳහා නිශ්චිත ලෙස දන්නා සහ නොවෙනස් මිලක් පවතී.

(2) වාර්ෂික ඉල්ලුම නොදනී.

(3) තොගවල සාමාන්‍ය ශේෂය, ඇණවුම්කළ ප්‍රමාණයෙන් තුනෙන් එකක.

(4) ඒකකයක රඳවාගැනීමේ පිරිවැය නොදනී. (ලකුණු 02)

1.6 *පහත දී ඇති එක් එක් ප්‍රකාශය සත්‍ය හෝ අසත්‍යදැයි දක්වන්න. සත්‍ය හෝ අසත්‍ය යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න:*

(1) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 37 අනුව, අසම්භාව්‍ය වගකීමක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතුය.

(2) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 01 අනුව, ව්‍යාපාරයක් අනපේක්ෂිත අනාගත කාලයක් දක්වා අඛණ්ඩව පවතින්නේයැයි උපකල්පනය කරමින් ව්‍යාපාරයෙ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබයි.

(3) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 02 අනුව, තොග සැමවිටම පිරිවැයට අගය කළ යුතුය.

(4) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 08 අනුව, කිසිදු අවස්ථාවක සමාගමකට එහ ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීමට ඉඩ නොදේ. (ලකුණු 04)

*අංක 1.7 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.7 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතෙහි 24 වන වගන්තියෙහි සඳහන් ප්‍රතිපාදන දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

1.8 **සමන්** සහ **අමල්, SA ඇසෝසියේට්ස්** හි හවුල්කරුවන් වූ අතර, ඔවුන් ලාභා'ලාභ සමානව බෙදාගන්නා ලදි. වර්ෂය තුළදී, **බිමල්** හවුල්කරුවෙකු ලෙස බඳවාගන්නා ලද අතර, **සමන්, අමල්** සහ **බිමල්** අතර ලාභා'ලාභ පිළිවෙලින් 3:2:1 අනුපාතයට බෙදාගැනීමට තීරණය කළේය.

**සමන්** සහ **අමල්ගේ** කැපකිරීමේ අනුපාතය (sacrificing ratio) ගණනය කරන්න. (ලකුණු 03)

1.9 **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගමේ** 2023 දෙසැම්බර් මාසයට අදාලව පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී:

| | |
|---|---|
| මූලික වැටුප | රු.2,200,000/- |
| වෙනත් දීමනා | රු.700,000/- |
| ණය සඳහා අඩුකිරීම් | රු.97,000/- |
| අත්තිකාරම් පුද්ගලික බදු / උපයනවිට ගෙවන බදු [Advance Personal Income Tax (APIT) / PAYE] අඩුකිරීම් | රු.352,000/- |

සේවක අර්ථසාධක අරමුදල [Employees Provident Fund (EPF)] සඳහා සේව්‍යයා 12% ක් දායක වන අතර, සේවකයා 8% ක් දායක වේ. තවද, සේවක භාර අරමුදල [Employees Trust Fund (ETF)] සඳහා සේව්‍යයා 3% කත දායක වේ. සේවකයින්ගේ මූලික වැටුප මත පදනම්ව, සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල සඳහා දායක වේ.

2023 දෙසැම්බර් මාසය සඳහා **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගම** විසින් ගෙවූ ශුද්ධ වැටුප ගණනය කරන්න. (ලකුණු 03)

1.10 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 10 - වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් අනුව, ගලපනු ලබන සිදුවීම් සඳහා උදාහරණ තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

**රමේෂ්**, තොග වෙළෙඳපොලෙන් බඩු මිලටගෙන මාර්ගගත ක්‍රමයට ගනුදෙනුකරුවන් වෙත භාණ්ඩ අලෙවිකරනු ලබන E-Grocery හි කේවලස්වාමි ව්‍යාපාරිකයා වේ. **රමේෂ්** විසින් සේවයට බඳවා ගන්නා ලද බෙදාහැරීමේ සේවකයා විසන් අයිතම බෙදාහරිනු ලබයි. බෙදාහරින ලද භාණ්ඩ ලැබුණු පසු ගනුදෙනුකරුවන්ට මුදලින් හෝ ණයපත් මඟින් ගෙවීම් කළ හැක.

E-Grocery හි වත්කම් සහ වගකීම් පහත සඳහන් පරිදි වේ:

*(රු.)*

| දිනට | 2023.03.31 | 2023.03.01 |
|---|---|---|
| යතුරු පැදිය, ධාරණ අගයට | 145,000 | 159,000 |
| කාර්යාල උපකරණ, ධාරණ අගයට | 70,000 | 75,000 |
| තොග | ? | 240,000 |
| ණය කාඩ්පත් මත ලැබිය යුතු මුදල් | ? | 55,000 |
| මුදල් හා බැංකු ශේෂය | 316,850 | 95,000 |
| ගෙවිය යුතු වියදම් | ? | 0 |

2023 මාර්තු මාසයට අදාලව පහත සඳහන් තොරතුරුද ලබාදී ඇත:

(1) මාසය තුළදී සදුකල ගැනුම් රු.560,000/- ක් වූ අතර, සියලුම ගැනුම් මුදල් පදනම මත සිදුකර ඇත.

(2) මාසය තුළ සිදුකල විකුණුම් රු.770,000/- ක් වූ අතර, මාසය තුළ වූ සෑම විකුණුමක් සඳහාම විකුණුම් මිලෙන් 20% ක දළ ලාභ ආන්තිකයක් (gross profit margin) **රමේෂ් විසින්** තබාගෙන ඇත. විකුණුම්වලින් 40% ක් ණය කාඩ්පත් මගින් සිදුකර ඇති අතර, ඉතිරි ප්‍රමාණය මුදල් මගින් සිදුකර ඇත. මාසය තුළදී ලැබිය යුතු ණයපත් මුදල් මත රු.344,850/- ක මුදලක් ව්‍යාපාරය විසින් බැංකුවෙන් එකතු කරගෙන ඇත.

(3) සෑම මාසයක් අවසානයේදීම බෙදාහැරීමේ සේවකයාට රු.25,000/- ක මාසික වැටුපක් **රමේෂ්** විසින් ගෙවනු ලබයි.

(4) 2023 මාර්තු මාසය සඳහා ජල හා විදුලි වියදම් රු.6,500/- ක් වූ අතර, ඒ සඳහා වූ ගෙවීම ඊළඟ මාසයේදී සිදුකර ඇත.

(5) මාසය තුළදී කිසිදු දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීමක් හෝ ඉවත් කිරීමක් සිදුකර නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2023 මාර්තු 31 දිනෙන් අවසන් මාසය සඳහා **E-Grocery** හි ශුද්ධ ලාභය **ගණනය කරන්න** (ලකුණු 07)

(b) 2023 මාර්තු 31 දිනට, **E-Grocery** හි ප්‍රාග්ධන (ස්කන්ධය) ශේෂය **ගණනය කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**හසිත්, විසිත්** සහ **තෙසිත්** අන්තර්ජාතික වෙළෙඳපොළ සඳහා අත්‍යන්ත්‍ර රෙදි අපනයනය කිරීමෙහි නිරත **සිලෝන් හැන්ඩ්ලූම්ස්** හි හවුල්කරුවෝ වෙති.

(1) හවුල් ගිවිසුමෙහි පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- ලාභා'ලාභ, **හසිත්, විසිත්** සහ **තෙසිත්** අතර පිළිවෙලින් 2:2:1 අනුපාතයට බෙදාගත යුතුය.
- **හසිත්, විසිත්** සහ **තෙසිත්** පිළිවෙලින් රු.50,000/-, රු.75,000/- සහ රු.125,000/- බැගින් වූ මාසික වැටුපකට හිමිකම් ලබය.
- 2023 ජනවාරි 01 දිනට පැවති ප්‍රාග්ධන ශේෂ මත හවුල්කරුවෝ 5% ක ප්‍රාග්ධන පොලියකට හිමිකම් ලබයි.
- හවුල්කරුවන් විසින් හවුල් ව්‍යාපාරය වෙත ලබාදුන් ණය සඳහා 15% බැගින් වූ වාර්ෂික පොලියක් ලැබීමට හවුල්කරුවෝ හිමිකම් ලබති.

(2) 2023 ජනවාරි 01 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම් ශේෂ පහත පරිදි වේ:

| | **ප්‍රාග්ධන ගිණුම් (රු.)** | **ජංගම ගිණුම් (රු.)** |
|---|---|---|
| **හසිත්** | 2,000,000 (බැර) | 150,000 (බැර) |
| **විසිත්** | 2,500,000 (බැර) | 300,000 (හර) |
| **තෙසිත්** | 3,000,000 (බැර) | 800,000 (බැර) |

(3) **හසිත්** විසින් 2023 ජූලි 01 දිනට, හවුල් ව්‍යාපාරයට රු.1,000,000/- ක ණය මුදලක් ලබාදුන් අතර, වර්ෂය සඳහා වූ පොලිය සඳහා තවමත් ගිණුම් තබා නොමැත. ණය ආපසු ගෙවීම් 2024 ජනවාරි 01 දින සිට ආරම්භ වේ.

(4) හවුල් ව්‍යාපාරයේ ව්‍යාපාර කටයුතු **විසිත්** ට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යන අතර, ඒ සඳහා ඔහුට මාසිකව රු.50,000/- ක බදු කුලියක් ගෙවිය යුතු වේ. නමුත්, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ කුලිය තවමත් ඔහුට ගෙවා නොමැති අතර, එය වියදමක් ලෙස ගිණුම් පොත්වලද වාර්තාකර නොමැත.

(5) 2023 මැයි 01 දින **තෙසිත්** විසින් රු.1,500,000/- ක ගැනිලි සිදුකර ඇත.

(6) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු පිරිවැටුම රු.30,000,000/- ක් වූ අතර, ශුද්ධ ලාභය රු.8,000,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, **සිලොන් හැන්ඩ්ලූම්ස්** හි පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) ලාභා'ලාභ විසර්ජන ගිණුම. (ලකුණු 05)

(b) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්. (ලකුණු 05)
(මුළු ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

**නිරෝගා මෙඩිකල් ඇසෝසියේෂන්,** අවශ්‍යතාවයන් පවතින සහ වැඩිහිටි පුද්ගලයින්ට අවශ්‍ය වෛද්‍ය පහසුකම් සැපයීම සඳහා වෛද්‍යවරුන් කණ්ඩායමක් විසින් ස්ථාපිත කර ඇති ලාභ අරමුණු කර නොගත් සංවිධානයකි.

2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) 2023 මාර්තු 31 දිනට, සංගමයෙහි සාමාජික වෛද්‍යවරුන් 150 ක් සිටි අතර, වෛද්‍යවරයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු.20,000/- ක් බැගින් විය. වෛද්‍යවරුන් 150 දෙනා අතුරින්, 10 දෙනෙකු වර්ෂය තුළදී සම්බන්ධ වී ඇති අතර, ඔවුහු ඉදිරි වර්ෂ දෙක සඳහාද වාර්ෂික සාමාජික ගාස්තු ගෙවා ඇත.

(2) සංගමයේ වත්කම් සහ වගකීම් පහත සඳහන් පරිදි වේ: *(රු.)*

| දිනට | 2023.03.31 | 2022.04.01 |
|---|---|---|
| වෛද්‍ය උපකරණ, ධාරණ අගයට | 2,790,000 | 3,000,000 |
| හිඟ සාමාජික මුදල් | 80,000 | 20,000 |
| ඉදිරියට ලද සාමාජික මුදල් | 400,000 | - |
| තොගය (ශල්‍ය ද්‍රව්‍ය හා බෙහෙත්) | 1,255,000 | 255,000 |
| උපචිත වියදම් - විදුලිය | 11,000 | 9,000 |
| මුදල් හා බැංකු ශේෂ | ? | 5,890,000 |

(3) වර්ෂය තුළදී, රු.150,000/- ක් වටිනා ශල්‍ය ද්‍රව්‍ය හා බෙහෙත් රාජ්‍ය නොවන සංවිධානයක් විසින් සංගමයට පරිත්‍යාග කර තිබූ අතර, සංගමය විසින් රු.7,200,000/- ක් වටිනා ශල්‍ය ද්‍රව්‍ය වර්ෂය තුළදී මිලදීගෙන තිබුණි.

(4) වර්ෂය තුළදී, රු.300,000/- ක් පිරිවැය වූ වෛද්‍ය උපකරණ මිලදීගෙන තිබුණි.

(5) සංගමයේ කටයුතු සඳහා හෙදියන් දෙදෙනෙකු සේවයේ නියුක්ත කර ඇති අතර, එක් එක් දවස අවසානයේදී ඔවුනට පැයකට රු.200/- බැගින් ගෙවනු ලබයි. වර්ෂය තුළදී, සංගමයේ කටයුතු වෙනුවෙන් හෙදියන් විසින් පැය 1,000 ක් වැය කර තිබුණි. සංගමයේ කටයුතුවලට සහභාගීවීම වෙනුවෙන් වෛද්‍යවරුන්ට කිසිදු පාරිශ්‍රමිකයක් ගෙවනු නොලැබේ.

(6) විදුලි වියදම් වෙනුවෙන් වර්ෂය තුළදී රු.96,000/- ක් ගෙවා තිබුණි. මසක් සඳහා වූ ගොඩනැගිලි කුලිය රු.10,000/- ක් වූ අතර, එය අදාල මාසයේදීම ගෙවිය යුතුය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **නිරෝගා මෙඩිකල් ඇසෝසියේෂන්** හි පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) ලැබීම් සහ ගෙවීම් ගිණුම. (ලකුණු 04)

(b) ආදායම් සහ වියදම් ගිණුම. (ලකුණු 06)
(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහ එක් සේවා දෙපාර්තමේන්තුවක් ඇති **සීමාසහිත සන්හිල් (පෞද්ගලික) සමාගමෙන්** පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී.

(1) 2024 මාර්තු මාසයට අදාලව අයවැයගත නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය පහත සඳහන් පරිදි සමාගම, ඇස්තමේන්තුගතකර ඇත:

| | රු. |
|---|---:|
| විදුලිය | 380,000 |
| කුලය | 368,500 |
| සේවක සුභසාධනය | 69,000 |
| සේවක අධීක්ෂණය | 138,000 |
| යන්ත්‍ර මත ක්ෂය | 154,700 |
| | **1,110,200** |

(2) පහත සඳහන් අයවැයගත දත්ත 2024 මාර්තු මාසයට අදාලව ලබාදී ඇත:

| | නිෂ්පාදන | | සේවා දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---:|---:|---:|---:|
| | 1 වන දෙපාර්තමේන්තුව | 2 වන දෙපාර්තමේන්තුව | | |
| වක්‍ර ද්‍රව්‍ය (රු.) | 575,000 | 485,000 | 340,000 | 1,400,000 |
| සේවක සංඛ්‍යාව | 28 | 13 | 5 | 46 |
| යන්ත්‍ර පිරිවැය | 8,960,000 | 4,810,000 | 1,700,000 | 15,470,000 |
| විදුලිය පරිභෝජනය (කිලෝවොට්) | 2,800 | 1,523 | 427 | 4,750 |
| භාවිත කරන ලද බිම් ප්‍රමාණය (වර්ග අඩි) | 3,700 | 1,550 | 250 | 5,500 |
| සෘජු ශ්‍රම පැය | 4,000 | 2,000 | - | - |
| පිරිවැය විභජනය - සේවා | 55% | 45% | - | - |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) එක් එක් දෙපාර්තමේන්තුව සඳහා පොදුකාර්ය පිරිවැය වෙන්කර විභජනය කරන්නේ කෙසේදැයි දැක්වෙන ප්‍රකාශනයක් **පිළියෙල කරන්න.** (ලකුණු 07)

(b) සෘජු ශ්‍රම පැය මත පදනම්ව, එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය **ගණනය කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

(a) පහත සඳහන් තොරතුරු **සීමාසහිත XYZ සමාගමේ, කාර්යය අංක RMX600** ට අදාල වේ:

| | |
|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | කිලෝග්‍රෑමයක් රු.1,600/- බැගින් කිලෝග්‍රෑම් 3,800 |
| සෘජු ශ්‍රමය - I **වන දෙපාර්තමේන්තුව** | පැයකට රු.2,000/- බැගින් පැය 250 |
| - II **වන දෙපාර්තමේන්තුව** | පැයකට රු.1,800/- බැගින් පැය 400 |
| නිෂ්පාදන පොදුකාර්ය | මුළු සෘජු ශ්‍රම පිරිවැයෙන් 150% |

සමාගම, විකුණුම් මිලෙන් 25% ක ලාභයක් පවත්වා ගනී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**කාර්යය අංක RMX600 මත අයකළ යුතු මිල ගණනය කරන්න.** (ලකුණු 05)

(b) **සීමාසහිත තරුෂි ගාමන්ට්ස් (පෞද්ගලික) සමාගම,** ඇඟළුම් නිෂ්පාදනයෙහි නියැලී සිටී.

පසුගිය සතියට අදාලව සේවකයෙකුගේ පහත තොරතුරු දී ඇත:

| | |
|---|---|
| දිනක සාමාන්‍ය වැඩකරන පැය ගණන | පැය 8 (සතියකට වැඩ කරන දින 5) |
| පැයක් සඳහා මූලික ගෙවීම | රු.300/- |
| එක් කමිසයක් නිෂ්පාදනය සඳහා ඉඩදෙන සම්මත කාලය | මිනිත්තු 15 |
| මූලික ප්‍රසාද දීමනාව | ඉතිරිකළ කාලයෙන් 80% ක් මූලික ගෙවීම මත |
| පසුගිය සතිය තුළදී, සේවකයා විසින් කමිස 275 ක් නිෂ්පාදනය කරන ලදී. | |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පසුගිය සතියට අදාලව සේවකයාගේ සම්පූර්ණ ඉපැයීම **ගණනය කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

### 07 වන ප්‍රශ්නය

**සීමාසහිත ග්ලෝබල් ට්‍රේඩිං (පෞද්ගලික) සමාගමේ** 2023 මාර්තු 31 දිනට, ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 1,000,000) | | 5,000 |
| 2022 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම් | | 9,550 |
| **පිරියත සහ උපකරණ, පිරිවැයට:** | | |
| මෝටර් වාහන | 12,000 | |
| කාර්යාල උපකරණ | 14,355 | |
| **2022 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| මෝටර් වාහන | | 3,671 |
| කාර්යාල උපකරණ | | 8,611 |
| මෝටර් වාහන ඉවත්කිරීමේ ගිණුම | | 3,500 |
| බැංකුවේ ඇති මුදල් | 8,201 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 8,290 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 3,219 |
| විකුණුම් | | 38,325 |
| විකුණුම් පිරිවැය | 12,694 | |
| 2023 මාර්තු 31 දිනට තොගය, පිරිවැයට | 4,350 | |
| ජලය සහ විදුලිය | 136 | |
| ප්‍රවාහන වියදම් | 459 | |
| ප්‍රචාරණ වියදම් | 1,182 | |
| විකුණුම් කොමිස් වියදම් | 1,526 | |
| කාර්යාල නඩත්තු වියදම් | 381 | |
| වැටුප්, වේතන, සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) | 10,339 | |
| බැංකු ගාස්තු | 16 | |
| කාර්යාල කුලිය | 725 | |
| අතුරු ලාභාංශ | 1,800 | |
| අනෙකුත් පරිපාලන වියදම් | 304 | |
| 2022 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 207 |
| ගෙවූ ආදායම් බදු | 1,450 | |
| ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් (EPF) සහ සේවක භාර අරමුදල් (ETF) | | 125 |
| බැංකු ණය (වාර්ෂික පොලිය 20%) | | 6,000 |
| | **78,208** | **78,208** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2023 මාර්තු 31 දිනට, තොගයේ ශුද්ධ උපලබ්ධි අගය [Net Realizable Value (NRV)] රු.4,275,000/- ක් විය.

(2) 2021 ජනවාරි 01 දින රු.3,000,000/- ක මුදලකට මිලට ගත් මෝටර් රථයක්, රු.3,500,000/- ක මුදලකට 2022 දෙසැම්බර් 31 දින විකුණන ලදී. විකිණීමෙන් ලද මුදල, මෝටර් වාහන ඉවත්කිරීමේ ගිණුමට බැර කිරීම හැර මොටර් රථය ඉවත් කිරීමට අදාලව වෙනත් කිසිදු සටහනක් තබා නොමැත. එදිනම රු.4,500,000/- ක පිරිවැයකට මෝටර් රථයක් මිලට ගන්නා ලද අතර, එය මෝටර් වාහන ගිණුමට නිවැරදිව හරකර ඇත.

(3) පිරියත සහ උපකරණ, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත ක්ෂය කරනු ලබන අතර, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| මෝටර් වාහන | වර්ෂ 4 |
| කාර්යාල උපකරණ | වර්ෂ 5 |

(4) 2023 මාර්තු 31 දිනට පහත සඳහන් ඉදිරියට කළ ගෙවීම් හා ගෙවිය යුතු වියදම් ගැලපිය යුතුව ඇත:

| | රු. |
|---|---|
| ඉදිරියට කළ කුලය | 175,000 |
| ගෙවිය යුතු විදුලිය | 25,000 |

(5) 2022/23 තක්සේරු වර්ෂය සඳහා වන ඇස්තමේන්තුගත ආදායම් බදු වගකීම රු.2,560,000/- කි. 2022/23 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වෙනුවෙන් රු.1,450,000/- ක් වර්ෂය තුළදී ගෙවා ඇත.

(6) ගනුදෙනුකරුවෙකු බුන්වත් වීම නිසා ඔහුගෙන් ලැබිය යුතු රු.400,000/- ක මුදල, බොල්ණයක් වශයෙන් ලියා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදී. තවද, 2023 මාර්තු 31 දිනට පැවති ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 5% ක ප්‍රතිපාදනයක් කිරීමටද තීරණය කර ඇත.

(7) 2023 ජනවාරි 01 දින සමාගම විසින් ණය මුදලක් ලබාගන්නා ලද අතර, ණය මත ප්‍රාග්ධනය ආපසු ගෙවීම සඳහා වසරක ණය සහන කාලයක් හිමි විය. කෙසේවෙතත්, වර්ෂයට අදාල පොලිය, සමාගම විසින් ගෙවා නොමැත.

(8) මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2023 ජූනි 30 දින ලබාදී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත ග්ලෝබල් ට්‍රේඩිං (පෞද්ගලික) සමාගමේ** කළමනාකාරීත්වයේ භාවිතය සඳහා, පහත සඳහන් දෑ පිළියෙල **කරන්න**:

(a) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභා'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 13)

(b) 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 12)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අන්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |